

පැතිකඩ

ආචාර්ය පාලිත ගනේවත්ත

ඩී.බී. ගේ සාහිත්‍ය සේවාව

7

මේ රටේ වෙසෙන අපේ දූ දරුවන් සඳහා ඩී.බී. කුරුප්පු මහතා ළමා කතන්දර පොත් හතක් ඉංග්‍රීසියෙන් ලියා ඇත.

මේ රටේ හැදෙන වැඩෙන අපේ දූ දරුවන්ට සිංහල බස ඉගැන්වීමට බොහෝ දෙමව්පියෝ දැඩි උත්සහයක් දරති. සිංහලය මෙන්ම ඕනෑම භාෂාවක් ඉගැන්විය යුත්තේ ඒ බස් වහරන ජනකායගේ සංස-්කෘ..යේම අංගයක් හැටියටය. මෙරට විවිධ ප්‍රන්තවල සිංහල පාසල් අරඹා අපේ දූ දරුවන්ට සිංහල බස ඉගැන්වීමට වැඩිහිටියන් දරන උත්සහය ප්‍රශංසා කටයුතුය. සිංහල පාසල් මගින් සංවිධානය කරන ළමුන්ගේ නැටුම් ගැයුම් ඇතුලත් විවිධ ප්‍රසංගවලින් භාෂාව ඉගැන්වීම සඳහා ලැබෙන පිටුවහල විශාලය. පන්ති කාමරයේ සිංහල පන්තියේදී ලබන දැනුමට වඩා වැඩි සිංහල දැනුමක් මේ විවිධ ප්‍රසංගවලට සූදානම් වන දූ දරුවන්ට ලැබෙයි.

මෙරට උපදින අපේ දරුවන්ගේ මුල් බස වන්නේ සිංහලය නොව බොහෝ විට ඉංග්‍රීසියයි. ශ්‍රී ලංකාවේදී සිංහල බසින් උගත් කුඩා දරුවන් මෙරටට පැමිණි විට ඉක්මනින් මෙරට බස වන ඉංග්‍රීසිය ඉගැන්වීමේ අරමුණින්දෝ ඇතැම් දෙමව්පියන් ළමුන් සමග සිංහලෙන් නොව ඉංග්‍රීසියෙන් කතාබස් කිරීමට පෙළඹෙති. ශ්‍රී ලංකාවේදී හොඳින් සිංහල කතා බස් කළ අපේ දරුවන් බොහෝ දෙනකු මෙරටට පැමිණ කලකට පසුව දෙමාපියන් සිංහලෙන් අසන ප්‍රශ්නයට පිළිතුරු දෙන්නේ ඉංග්‍රීසියෙනි. පාසලේදීත් අවට හැම තැනත් ඉංග්‍රීසි කතා කරන රටක ඒ පරිසරයට හුරුවන ඔවුන් අතින් සිංහල බස ගිලිහී යාම පුදුමයක් නොවේ. දෙමාපියන් සිංහලෙන් අසන පැනයට ඉංග්‍රීසියෙන් පිළිතුරු දීමට තරම් භාෂා දැනුම හා ආත්ම විශ්වාසය ඔවුන් තුළ ඇතිවීම නිසාය. යාන්තමින් හෝ සිංහලය අපේ දරුවන්ගේ මුවින් ගිලිහී නොවී රැකෙන්නේ සිංහල පාසල් හා සිංහල සංස්කෘතික අංශවලට දරුවන් පුහුණු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

සිංහල සංස්කෘතික අංග ඉතිහාසය හා සිංහල සිංහල ජන ජීවිතය පිළිබඳ සිංහලෙන් කියවීමට තරම් ප්‍රමාණවත් දැනුමක් මෙරට උපන් අපේ දරුවන්ට ලබා ගත හැක්කේ කලාතුරකිනි. මේ දැනුම ඉංග්‍රීසියෙන් ලබා දීම තුළින් මෙරට උපදින අපේ දරුවනට අපේ කම ගැන අවබෝධයක් ලබාදිය හැකිය. මෙන්න මෙතනදීයි කුරුප්පු මහතා ඉංග්‍රීසියෙන් ලියූ ළමා පොත්වල වැදගත්කම අපේ අයට අවබෝධ වන්නේ.

ළමා පොත්



ඩී. බී. ඉංග්‍රීසියෙන් ලියූ ළමා පොත් හත මෙසේය.

1. Saradiel - The Sri Lankan Bushranger
2. Kekille of Sri Lanka, The king of unfailing justice
3. Mahadenamuttha - The Great know - All of Sri Lanka
4. Andare - The Sri Lankan court jester
5. Surrrender or Betrayal - Sri Lankan Spirit World
7. Gamarala - Folk tales from Sri Lanka

මේ පොත් පෙළ දෙආකාරයකින් වැදගත් වෙයි.

පළමු කරුණ පොත් හතේ නම් දෙස බැලීමේදී වැටහෙනු නිසැකය. සරදියෙල්ගේ කතාව ලංකාවේ ගම්බඳ වීරයෙකුගේ කතාවකි; ඉංග්‍රීසි සාහිත්‍යයේ එන රොබින් හුඩ් හෝ ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ ගැමි වීරයෙකු වූ නෙඩ් කෙලි සිහිපත් කරවන්නකි. අන්දරේ, මහදැනමුත්තා, කැකිල්ලේ රජ්ජුරුවෝ අප කුඩා දරුවන් ලෙස වැඩිහිටියන්ගෙන් අසා දැනගත් ගමකතාය. ගරා යකා සිංහල ගැමි සමාජයේ මුල්බැස ගත් විශ්වාස මත පදනම් වූ අදෘශ්‍යමාන බලවේග මුල්කරන වෘතාන්තයකි. ලක්දිව අන්තිම රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ මැද මහනුවර දී අල්ලාගත් පුවතට ලක්දිව ඉතිහාසයේ වැදගත් තැනක් හිමිවෙයි. සිංහල ගැමි සමාජයත් එතුළ මුල් බැසගත් සිරිත් විරිත් විශ්වාස ගැමි ජීවන ක්‍රමය ගැන හොඳ අවබෝධයක් ලැබීමට මේ කුඩා පොත්වලින් මහත් පිටුවහලක් ලැබෙයි.

මෙරට උපන් සිංහල දරුවෝ සරදියෙල් හෝ මහදැනමුත්තා හෝ ගමරාළ හෝ කවරෙකුදැයි නොදනිති. එබැවින් සෑම පොතකම මාතෘකාව සමග එහි අර්ථාවබෝධය පිණිම උප මාතෘකාවක් යෙදීම අත්‍යාවශ්‍යය. එවැනි උප මාතෘකාවක් මේ හැම පොතටම යොදා ඇත.

දෙවන කරුණ නම් මේ ළමා පොත්වල කතාව ඉදිරිපත් කළ ආකාරය හා එහි භාෂා විලාසයයි. තමන් ලියන ඉංග්‍රීසි භාෂා විලාසය මෙරට ඉංග්‍රීසි පරිසරයක හැදෙන දූදරුවන්ට ගැලපේද යන සැකය කතුවරයා තුළ පැන නගී. ඒ සැකය දුරු කරනු පිණිස තමන් ලියූ ළමා පොත්වල බස සංස්කරණය සඳහා ඩී.බී. කුරුප්පු මහතා හත්වන වසරේ උගන්නා ශිෂ්‍යයෙකුගේ සහාය පතයි. මේ ක්‍රියාවලිය පරිණත ලේඛකයකු සතු නිර්මාණාත්මක නිහතමානය ලෙස හැඳින්වීමට කැමැත්තෙමි.

ලේඛකයා ලියන්නේ පාඨකයන් උදෙසාය. ළමා පොතක් ලියනවිට ළමයින්ට උචිත භාෂා ශෛලියක් යොදාගත යුතුය; ළමුන්ගේ සිත් ගන්නා පරිදි කතාව ඉදිරිපත් කළ යුතුය. ඩී.බී. මේ සඳහා යෝග්‍ය වූ උපක්‍රමයක් යොදා ගනී. පොත් පෙළ ආරම්භ වන්නේ මෙල්බර්න් නුවර වාසය කරන පියකු පුතකු අතර සංවාදයක් ලෙසිනි. 'සරදියෙල්' ගැන සංවාදයකට මග පාදන අයුරින් උනන්දුවක් ඇති කිරීමට පියපුතු සංවාදය ඉවහල් වෙයි.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු මැද මහනුවර දී අල්ලා ගැනීමේ කතාව ඇරඹෙන්නේ මෙල්බර්න් නගරයේ පැවති ශ්‍රී ලංකා නිදහස් දින උත්සවයකට සහභාගී වීමේ පුවත පදනම් කරගත් කතාබහකිනි. මේ අයුරින් රචනා කළ කතා පොත් කියවන්ට පටන් ගත් මෙරට ඉංග්‍රීසිය හදාරන අපේ දරුවන් ඒ පොත් අග දක්වා කියවීමට පෙළඹෙනු නියතය. කතා පෙළම ලිය වි ඇත්තේ මෙල්බර්න් නුවර වාසය කළ ප්‍රකට විද්වතකු වූ එල්. බී. ඒකනායකයන්ට ගෞරවයක් ලෙසින් උපටා ගත් එල්.බී., ඔහුගේ පුත් ටිකිරි හා එල්.බී.ගේ සංවාද ලෙසින්ය. ළමා කාතාවලට ගැළපෙන ලෙස මෙල්බර්න් නුවර වෙසෙන දරුවකු වන දිනුක මාපාගේ සිත් ඇදනා සිතුවම් වලින් පොත් කිහිපයකම අන්තර්ගතය සැරසී ඇත.

මෙරට ට සංක්‍රමණය වූ දෙමාපියන් බොහෝ දෙනෙකු ඔවුන්ගේ දූ දරුවන් සිංහල කමින් ඈත්වීම පිළිබඳව කනස්සල්ලෙන් පසුවන බව මම දනිමි. ඔවුන්ගෙන් කී දෙනෙකු තම දූ දරුවනට මේ ළමා පොත් කියවන්නට සැලැස්වූයේ දැයි මම නොදනිමි. ඉංග්‍රීසි බසින් මේ කතා කියවන දරුවන් තුළ තම දෙමාපියන්ගේ මව්බිම ගැන උනන්දුවක් ඇතිවනු නිසැකය.

ඒ උනන්දුව හරහා දරුවන් කිහිප දෙනෙකු හෝ ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතික හර පද්ධතිය ගැන හැදෑරීමට උනන්දු විය හැකිය. ඒ උනන්දුව හරහා වඩාත් හොඳින් ශ්‍රී ලංකාව ගැන හැදෑරීමට සිංහල බස උගත යුතුය යන හැඟීම ඔවුන් කිහිප දෙනකු තුළ පුවඳ ඇතිවීම අරුමයක් නොවේ. මෙරට උපන් අපේ දරුවන් සිංහල බස ප්‍රගුණ කළහොත් ඔවුනතරින් දෙතුන් දෙනෙකු හෝ සිංහලෙන් ලිවීමට පෙළඹෙනු ඇතැයි සිතිය නොහැකිද ?

මෙරට විප්‍රවාසී සිංහල සාහිත්‍යයක් ගොඩනැගීමට දරන ප්‍රයත්නයට එවැනි නිර්මාණ බිහිවීම විශාල පිටුවහලක් ලෙසය මට පෙනෙන්නේ.

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial Law
- Sale of Business
- Conveyancing
- Powers of Attorney
- Wills & Estate Planning
- Migration Law

Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia